දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2014 පුනර් පරීක්ෂණය - 2018 ජුනි/ජූලි

Bachelor of Arts General (External) Degree Part I Repeat Examination 2014 – June/July 2018

ආවිසා 2.2 - සාර්ව ආර්ථික න්‍යාය

# ECG 2.2 - Macroeconomic Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න

---

01. i. 'ව්‍යාපාර චක්‍රය' යන්නෙන් ඔබට අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 04)

ii. උචිත රූප සටහන් යොදා ගනිමින් ව්‍යාපාර චක්‍රයක විවිධ අවධීන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. "ව්‍යාපාර චක්‍රයක හැරවුම් ලක්ෂයයන් විස්තර කළ හැකි මූලිකතම සාධකය වන්නේ ප්‍රාග්ධනයේ ආන්තික කාර්යක්ෂමතාව හෙවත් අපේක්ෂිත ලාභ අනුපාතිකයේ සිදුවන විචලතාවයන්ය." (ජෝන් මෙනාඩ් කේනිස් 1936) සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

02. i. ස්ථාවර මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය සහ මූර්ත ජාතික ආදායම (Gross National Product at Constant Price and Real National Income at Constant Prices) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. එක්තරා කල්පිත ආර්ථිකයක සාර්ව ආර්ථික විචල්‍යයන් කිහිපයක් පහත සමීකරණවලින් විස්තර වේ යැයි සිතන්න. ($ මිලියන වලින්)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | $C = \$\,20 + 0.80\,(Y - T_n)$ |
| $T_n$ | $=$ බදු $(T_x)$ - සංක්‍රාම $(T_r)$ |
| පෞද්ගලික ආයෝජනය | $I = \$\,60$ |
| බදු ආදායම | $T_x = \$\,40$ |
| සංක්‍රාම ගෙවීම් | $T_r = \$\,10$ |
| රජයේ වියදම් | $G = \$\,30$ |

(අ) දෙනු ලැබ ඇති තොරතුරු අනුව මෙම ආර්ථිකයේ තීරණය වන සමතුලිත ජාතික ආදායම $ 430 බව ඔප්පු කරන්න.

(ලකුණු 06)

(ආ) මෙම ආර්ථිකයේ ඊ ළඟ මූල්‍ය වර්ෂය සඳහා යෝජිත ෆිස්කල් ප්‍රතිපත්තිය යටතේ රජයේ වියදම් $ මිලියන 10 කින් ඉහළ නැංවීමටත්, එම වියදම මුළුමනින්ම බදු මගින් මූල්‍යනය කිරීමටත් තීරණය වූයේ නම් එම ෆිස්කල් ප්‍රතිපත්තියේ ආදායම් ප්‍රතිවිපාකය ගණනය කරන්න.

(ලකුණු 05)

(ඇ) එම ගණනය කිරීම් මත ඔබට නිරීක්ෂණය වන දෑ පැහැදිලි කරන්න.

(ලකුණු 04)

03. i. ‘මුදලට ඇති ඉල්ලුම’ යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 05)

ii. මුදලට ඇති ඉල්ලුම පිළිබඳ කේන්ස් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ද්‍රවශීලතාවරණ න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

04. i. ‘මුදල් සැපයුම පිළිබඳ මුදල් ගුණක න්‍යාය’ පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. කල්පිත ආර්ථිකයක මූල්‍ය සමස්තයෙන් ලබාගත් තොරතුරු පෙළක් පහත දැක්වේ. ඒවා ඇසුරු කොටගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| අධිබලැති (සංචිත) මුදල් ප්‍රමාණය | = | රුපියල් මිලියන 1000 |
| මහජනයා සතු ව්‍යවහාර මුදල්/බැංකු තැම්පතු අනුපාතය | = | 8% |
| වාණිජ බැංකු සංචිත අනුපාතිකය | = | 7% |

(අ) ආර්ථිකය සඳහා වන මුදල් ගුණකය ගණනය කරන්න.

(ලකුණු 03)

(ආ) මුළු මුදල් සැපයුම ගණනය කරන්න.

(ලකුණු 03)

(ඇ) ඉහත 4) ii (අ) සහ (ආ) ප්‍රශ්නයන්ට ඔබ සැපයූ පිළිතුරු මත පදනම් ව රටක මුදල් සැපයුම තීරණය වීම කෙරෙහි බලපානු ලබන සාධක පරීක්ෂා කරන්න.

(ලකුණු 02)

05. එක්තරා විවෘත ආර්ථිකයක් පහත ලබා දී ඇති ව්‍යුහාත්මක සමීකරණයන්ගෙන් විස්තර වේ යැයි සිතන්න. (සියළු සංඛ්‍යා $ මිලියන වලිනි)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | $C = 47.50 + 0.85\,(Y - T_n)$ |
| ශුද්ධ බදු | $T_n = 100$ |
| රජයේ වියදම් | $G = 100$ |
| පෞද්ගලික ආයෝජනය | $I = 100 - 5i$ |
| ශුද්ධ අපනයන | $X_n = 50 - 0.10Y$ |
| මුදල් සැපයුම | $M^s = 100$ |
| මුදල් ඉල්ලුම | $L = 0.20Y - 10i$ |

i. මෙම ආර්ථිකය සඳහා (ඇස්තමේන්තු වන) IS සහ LM ශ්‍රිත ගණනය කරන්න.

(ලකුණු 08)

ii. සමතුලිත ජාතික ආදායම හා පොළී අනුපාතිකය ගණනය කරන්න.

(ලකුණු 02)

iii. සමතුලිත ආදායමට අදාළව
(අ) පෞද්ගලික පරිභෝජන වියදම
(ආ) පෞද්ගලික ආයෝජන වියදම
(ඇ) පෞද්ගලික ඉතුරුම් ප්‍රමාණය සහ
(ඈ) ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ශේෂය
ගණනය කරන්න.

(ලකුණු 06)

iv. රජයේ වියදම ඩොලර් මිලියන 10 කින් ඉහළ යාමක් සමතුලිත ජාතික ආදායම හා ගෙවුම්ශේෂය මත ඇති කරනු ලබන ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

06. i. රජයේ වියදම් ඉහළ යාමක් හා සම්බන්ධ තෙරපුම් ප්‍රතිවිපාකය (Crowding out effect) යනු කුමක් දැ යි අර්ථ දක්වා එවැන්නක් ක්‍රියාත්මක වන යාන්ත්‍රණය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. "තෙරපුම් ප්‍රතිවිපානයේ තරම IS සහ LM වක්‍රයන්හි බෑවුමෙහි ස්වරූපය මත තීරණය වේ" උචිත රූප සටහන් යොදා ගනිමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

07. i. නූතන සාර්ව ආර්ථික විද්‍යාවේ දී හමුවන සමස්ත ඉල්ලුම් වක්‍රය (Aggregate Demand Curve or AD) වමේ සිට දකුණට පහළට බෑවුම් වීමට බලපාන විවිධ හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ii. නූතන සාර්ව ආර්ථික විද්‍යාවේ දී හමුවන සමස්ත සැපයුම් වක්‍රයේ (Aggregate Supply Curve) විවිධ පරාසයන් (Ranges) සහේතුකව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

08. පහත එක් එක් සංකල්ප යුගලයන් අතර වෙනස පැහැදිලි වන සේ විග්‍රහාත්මක සටහන් ලියන්න.

i. ස්ථාවර විනිමය අනුපාතිකය සහ නම්‍ය විනිමය අනුපාතිකය

ii. ජාත්‍යන්තර වෙළඳාමේ දී හමුවන නිරපේක්ෂ වාසි සහ සාපේක්ෂ වාසි

iii. විශේෂ හැරගැනුම් අයිතිවාසිකම් (SDR) සහ යූරෝ (EURO) මුදල් ඒකක.

(එක් කොටසකට ලකුණු 07 බැගින් උපරිම ලකුණු 20)